සැ. යු. - 2020.01.17 වැනි දින පළ වූ අංක 2159 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නෙවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,160 - 2020 ජනවාරි මස 24 වැනි සිකුරාදා - 2020.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — | රජයේ නොවන දැන්වීම් ... ... ... | 154 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 148 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 157 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — | | |


සැ. යු. -(i) ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 ජනවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 ජනවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 2020 ජනවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 පෙබරවාරි මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජනවාරි මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - මොරටුව

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2019

මොරටුව දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2020.01.30 වැනි දින ප. ව. 1.00 ට මොරටුව පොලිස් ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් භාණ්ඩ පිළිබඳව හිමිකම් කියන්නන් සිටී නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට ලිඛිතව ඉදිරිපත් කළ යුතු වේ.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ සහ පොලිස් ස්ථානාධිපතිවරයාගේ අවසරය ඇතිව එදින ප. ව. 12.30 සිට 1.00 දක්වා අතර කාලය තුළ භාණ්ඩ පරීක්ෂාවට ඉඩ දෙනු ලැබේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවලදී එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා අත්පිට මුදල් ගෙවිය යුතු අතර චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

05. භාණ්ඩ මිල දී ගැනීමේ දී අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත අත්‍යවශ්‍ය වේ.

06. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ එවලේ ම වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

දමින්ද රාමනායක වැලිගොඩපිටිය,
අතිරේක දිසා විනිසුරු/අතිරේක මහෙස්ත්‍රාත්,
මොරටුව.

2019 දෙසැම්බර් මස 24 වැනි දින,
මොරටුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| | *නඩු අංකය* | *භාණ්ඩය* |
|---|---|---|
| 01. | 81225 | පස් කියුබ් 01යි |
| 02. | 80631 | පස් කියුබ් 01යි |
| 03. | 59603 | WP - BEA 3323 යතුරු පැදි 01යි |
| 04. | 32225 | WP YS 3489 ත්‍රීරෝද රථ 01යි (අබලි) |

01-635

## මහෙස්ත්‍රාත් අධිකරණය - මාතර

අධිකරණය වෙත ඉදිරිපත් කොට රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත උපලේඛනයේ අනු අංක 01 සිට අනු අංක 84 දක්වා සඳහන් භාණ්ඩ.

2020.02.15 වැනි දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත අනු අංක 01 සිට 84 දක්වා හිමිකම් පාන්නකු වේනම් වෙන්දේසි පැවැත්වීමට නියමිත දිනට හෝ එදිනට පෙර ස්වකීය හිමිකම් අදාළ ලියවිලි හා සාධක සමග අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

02. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.00 සිට පැවැත්වීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

03. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩ එවෙලේ ම මුදල් ගෙවා එදිනම පස්වරු 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවල අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. ගැණුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

06. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් ඇතොත් එදින වෙන්දේසි රාජකාරි අවසන්වීමට පෙර අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා හරහා අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් වන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

07. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගැනීම වෙනුවෙන් කරනු ලබන සියලුම ගෙවීම් මුදල්වලින් සිදු කළ යුතු අතර චෙක්පත් වලින් කරනු ලබන කිසිදු ගෙවීමක් භාරගනු නොලැබේ.

08. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරනු ලබන බැව් තවදුරටත් දන්වා සිටිමි.

ඉසුරු නෙත්තිකුමාරගේ,
මහෙස්ත්‍රාත්,
මාතර.

2020 ජනවාරි මස 02 වැනි දින,
මාතර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 01. | 60359 (BR. 1183/07) | උදලු 02, ගැරුම් වට්ටිය |
| 02. | 62360 (BR. 3184/16) | සවල, උදැල්ල, වතුර මෝටරය |
| 03. | 42818 (BR. 990) | පිත්තල පහන |
| 04. | 44003 (BR. 1024/06) | මෝටරය, වයර් රෝල, ජ්ලෑෂරය |
| 05. | 65654 (BR. 1743/16) | හෙල්මට් 01 |
| 06. | 43883 (BR. 174/11) | ක්‍රිකට් පිත්ත |
| 07. | 21532 | පොරව |
| 08. | 36090 (BR. 2223/13) | කැත්ත |
| 09. | 98476 (BR. 171/13) | අලවංගුව |
| 10. | 59212 (BR. 2558/11) | සුදු හඳුන් කැබලි කිහිපයක් |
| 11. | 63353 | ටෙන්ට් රෙද්ද, තංගුස් නූල් 02යි |
| 12. | 53213 | සවල, වේවැල් කූඩය |
| 13. | 55311 (BR. 3252/14) | ඇස්ට්‍රල්පූල් විදුලි පහන් 02 හා අමතර උපාංග |
| 14. | 17313 | ගැරුම් වට්ටි 01යි |
| 15. | 34348 (BR. 349/10) | වතුර මෝටර්, වතුර ටැංකිය |
| 16. | 2329 (BR. 1304/10) | වාහන බැටරි 02යි |
| 17. | 72395 (BR. 3447/15) | ඕලොක් මැෂින් 02යි, ඉලෙක්ට්‍රොනික් මැෂින් 02යි, මෝටර 02යි |
| 18. | 36772 (BR. 2294/15) | වායු පීඩන යන්ත්‍ර 01යි |
| 19. | 90701 (BR. 119/18) | වීල් බැරෝ 01යි |
| 20. | 88499 (BR. 3241/12) | ටයර් 01යි |
| 21. | 93281 (BR. 2842/08) | වාහන බැටරි 02යි, JCB යන්ත්‍රයක උපාංග කොටස් කිහිපයක් |
| 22. | 29399 (BR. 1036/10) | බිත්තර අසුරන තැටි 08යි |
| 23. | 19728 (BR. 1090/14) | මඩ වීල් 02යි, ඩිෆෙරෙන්සර් 01යි |
| 24. | 11194 | සර්ෆින් බෝඩ් 01යි, සුදු පාට ප්ලාස්ටික් හාන්සි පුටු 01යි, සමර් හට් 01යි |
| 25. | 16754 | විශාල කූඩ |
| 26. | 19275 (BR. 1320/19) | විශාල කූඩ |
| 27. | 47121 (BR. 214/16) | සර්ෆින් බෝඩ් 01යි |
| 28. | 19347 | ගැරුම් වට්ටි 01යි |
| 29. | 93582 | ටයර් 02යි |
| 30. | 84828 (BR. 2358/07) | වතුර මෝටර් 01යි |
| 31. | BR 1698/16 | මාලු අල්ලන අතංගුව |
| 32. | 4225 (BR. 2838/08) | වාහන බැටරි 01යි |
| 33. | 56355 (BR. 2177/16) | හෝස්බට කැබලි 03යි |
| 34. | 65759 | සාස් පාන් 01යි |
| 35. | 59599 (BR. 1065/16) | වාහන බැටරි 02යි |
| 36. | 1866 (BR. 1223/13) | වාහන බැටරි 01යි |
| 37. | 21123 (BR. 1069/10) | වාහන බැටරි 05යි |
| 38. | 7968 (BR. 372/14) | ෆලයිවුඩ් ෂීට් 04යි |
| 39. | 73393 | කැසට් යන්ත්‍ර 01යි |
| 40. | 73393 | රූපවාහිනී යන්ත්‍ර 01යි |
| 41. | 73393 | විදුලි පංකා 01යි |
| 42. | BR. 2222/11 | රත්‍රන් භාණ්ඩ සෑදීමට ගන්නා ආයුධ කට්ටල 01යි, යකඩ අඩු 02යි |
| 43. | BR. 533/14 | නියනක් |
| 44. | BR. 513/11 | බයිසිකල් යතුරු 04ක්, ඉස්කුරුප්පු නියනක් |
| 45. | BR. 1035/11 | උදැල්ල |
| 46. | BR. 563/10 | විසි කැත්ත |
| 47. | BR. 3443/13 | තංගුස් ලනුව |
| 48. | BR. 218/10 | කැත්ත |
| 49. | BR. 2043/13 | මේෂන් හැන්ද |
| 50. | 21419 | බිම් තරාදිය |
| 51. | 20154 | බිම් තරාදිය |
| 52. | 19888 | 1. නියන<br>2. ග්‍රයින්ඩර් 01<br>3. මීටර් කෝදුව<br>4. අඩු මිටිය |
| 53. | 438 | මිට සහිත පොරව |
| 54. | 27597 | උදලු 01යි |
| 55. | 27054 | මිටියක් |
| 56. | 46080 | පොරවක් |
| 57. | 35417 | කොම්ප්‍රෙෂර් එකක් හා හෝන් එකක් |
| 58. | අංක රහිතව | වයර් රෝලක් |
| 59. | BR. 832/10 | පිඟන් භාණ්ඩ |
| 60. | 47569 | සවලක් |
| 61. | 36407 | සවලක් |
| 62. | 58593 | හට්ටියක්, පොරවක්, පිඟානක්, සරමක්, විදුලි පන්දමක්, නියනක්, හිරමන තලයක් |
| 63. | BR. 09/2019 | තොප්පියක් |
| 64. | 85152 | ගෑස් ලිපක් |
| 65. | BR. 1698/15 | බයින්ඩින් කම්බි |
| 66. | 19791 | සවල් 02යි |
| 67. | 36407 | සවලක් |
| 68. | 37367 | සවලක් |
| 69. | 9544 | විදුලි යතු කැටය |
| 70. | 66527 | වයර් |
| 71. | 21532 | පොරවක් |
| 72. | 18182 | අතකොලුවක් |
| 73. | 19791 | උදැල්ලක් |
| 74. | BR. 3242/15 | කුරුදු මිටියක් |
| 75. | 5352 | හෝස් එකක් |
| 76. | 36407 | උදැල්ලක් |
| 77. | 36407 | උදැල්ලක් |
| 78. | 10783 | උදැල්ලක් |
| 79. | 47055 | අලවංගුවක් |
| 80. | 10295 | අලවංගුවක් |
| 81. | 10783 | අලවංගුවක් |
| 82. | 76046 | නියනක් |
| 83. | 17313 | සුදු පාට බකට් එකක් |
| 84. | 78057 | නියනක් |

**මහෙස්ත්‍රාත් අධිකරණය - ත්‍රිකුණාමලය**

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2020.01.29

ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කර ඇති හා හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2020.01.29 වැනි දින ප. ව. 3.00 ට කින්නියා පොලිස් ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂාකර බැලිය හැකි ය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිළ දී ගනු ලබන ද්‍රව්‍යයන් එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු ය. සියලුම හිමිකම් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

05. ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් රැගෙන පැමිණිය යුතු ය.

එම්. එච්. එම්. හම්සා,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
ත්‍රිකුණාමලය.

**ප්‍රසිද්ධ වෙන්දේසියේ නඩු භාණ්ඩ ලැයිස්තුව - 2020.01.29**

මහෙස්ත්‍රාත් අධිකරණය - ත්‍රිකුණාමලය
(කින්නියා පොලිස් ස්ථානයේ දී විකුණනු ලබයි)

| *අනු. අංකය* | *නඩු අංකය* | *නඩු භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| | | **වැලි** | |
| 01. | අංක රහිත | වැලි | කියුබ් 130 |
| | | **බොරළු** | |
| 02. | MC 3349/19 | බොරළු | කියුබ් 03 |
| 03. | MC 4012/19 | බොරළු | කියුබ් 03 |
| | | **සිප්පි** | |
| 04. | MC 1302/18 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 50 |
| 05. | MC 2126/18 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 19 |
| 06. | MC 3288/19 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 190 |
| 07. | MC 2320/19 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 270 |
| 08. | MC 4010/19 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 25 |
| 09. | MC 4095/19 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 165 |
| 10. | MC 4847/19 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 75 |
| 11. | MC 4848/19 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 250 |
| 12. | MC 4978/19 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 100 |
| 13. | MC 5547/19 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 300 |
| 14. | MC 6014/19 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 03 |
| 15. | MC 5036/19 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 227 |
| 16. | MC 5035/19 | සිප්පි කුඩු (කි. ග්‍රෑ. 50 බැගින් උර) | 228 |
| | | **බෝට්ටු** | |
| 17. | BR 2701/14 | ඔරුව | 01 |
| 18. | BR 1099/18 | බෝට්ටුව (අධික ලෙස හානි වී ඇත) | 01 |
| 19. | MC 731/15 | බෝට්ටුව (අධික ලෙස හානි වී ඇත) | 01 |
| 20. | AR 327/19 | බෝට්ටුව (අධික ලෙස හානි වී ඇත) | 08 |

01-781/1

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - ත්‍රිකුණාමලය**

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2020.01.30

ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කර ඇති හා හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2020.01.30 වැනි දින ප. ව. 3.00 ට ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් අධිකරණයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන්වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂාකර බැලිය හැකි ය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිළ දී ගනු ලබන ද්‍රව්‍යයන් එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු ය. සියලුම හිමිකම් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

05. ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් රැගෙන පැමිණිය යුතු ය.

එම්. එච්. එම්. හම්සා,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
ත්‍රිකුණාමලය.

**ප්‍රසිද්ධ වෙන්දේසියේ නඩු භාණ්ඩ ලැයිස්තුව - 2020.01.30**

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| | | **වැලි** | |
| 01. | MC 21/20, MC 24/20, MC 22/20, MC 5816/19, MC 5439/19, MC 5026/19, MC 4926/19, MC 4798/19, MC 4750/19, MC 4749/19, MC 4554/19, MC 4555/19, MC 5514/19 | වැලි | කියුබ් 13 |
| 02. | නඩු අංක රහිත | වැලි (චීන වරාය පොලිස් ස්ථානයේ) | කියුබ් 04 |
| 03. | MC 5402/19 | මුහුදු වැලි පොහොර බෑග් 08, සවල් 01 | 09 |
| | | **බොරළු** | |
| 04. | MC 5438/19, MC 5359/19, MC 5221/19, MC 5223/19, MC 5222/19, MC 4623/19, MC 4622/19, MC 3378/19 | බොරළු | කියුබ් 24 |
| | | **සිප්පි** | |
| 05. | BR 1193/19 | සිප්පි කටු (කි. ග්‍රෑ. 50 උර) | 300 |
| 06. | BR 1159/19 | සිප්පි කටු (කි. ග්‍රෑ. 50 උර) | 600 |
| | | **වාහන** | |
| 07. | MC 4245/15 | EPLG 4864 දරන ටාටා වර්ගයේ බට්ටා ලොරි රථය | 01 |
| | | **අනෙකුත්** | |
| 08. | MC 1343/17 | සැම්සුන් M 290 KS වර්ගයේ කළු පාට ජංගම දුරකථනය | 01 |
| 09. | AR 57/15 | සැම්සුන් DOUS වර්ගයේ කළු පාට ජංගම දුරකථනය | 01 |
| 10. | AR 1023/18 | සැම්සුන් වර්ගයේ CE 0168 දරන සුදු පාට ජංගම දුරකථනය | 01 |
| 11. | AR 1052/19 | අංක 69941154 දරන ලුමාලා පාපැදිය | 01 |
| 12. | MC 4565/07 | ඔමේගා වර්ගයේ පාපැදිය | 01 |
| 13. | AR 1244/19 | විවිධ ප්‍රමාණයන්ගෙන් යුත් යකඩ කැබලි 11 | 11 |
| 14. | AR 1053/19 | එස්. එෆ්. 400 වර්ගයේ සුදුපාට ප්ලාස්ටික් තරාදි 01, පිත්තල භාණ්ඩ 184, කොළ හා කහ පැහැති රෙදි බෑග් 01, නිකල් පැහැති පිගන් 01යි | 187 |
| 15. | MC 6114/19, MC 6115/19, MC 6010/19, MC 6008/19, MC 6013/19, MC 4604/19, MC 4394/18, MC 4554/19, MC 4555/19, MC 4135/19, (අංක රහිත සවල් 02) | සවල් | 12 |
| 16. | MC 4798/19 | ලොකු යකඩ බාල්දි 02, උදළු 01, සවල් 03 | 06 |
| 17. | MC 23/20 | උදළු 01, සවල් 01 | 02 |
| 18. | MC 21/20 | උදළු 01, සවල් 01 | 02 |
| 19. | MC 6034/19 | සවල් 03, උදළු 01 | 04 |
| 20. | MC 5251/18, MC 5250/18 | කුළුගෙඩි | 02 |
| 21. | MC 4701/17 | පොප්ලර් | 01 |
| 22. | අංක රහිත | පොරොව 11 | 11 |
| 23. | අංක රහිත | ලී කපන අත් කියත් | 09 |
| 24. | අංක රහිත | TCL වයර් 30m පමණ | 01 |
| 25. | අංක රහිත | යතුරු සෙට් | 01 |
| 26. | අංක රහිත | බැරල් | 10 |
| 27. | අංක රහිත | තඹ දඟර | 10 |

01-781/2

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - පූගොඩ**

අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. පූගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද භාණ්ඩ අංක සොයාගත නොහැකි වූ පහත සඳහන් භාණ්ඩ 2020.02.10 දින මධ්‍යහ්න 12.00ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් මේ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන පෙ. ව. 11.30 සිට මධ්‍යහ්න 12.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්තුමියගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂාකර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිළ දී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතු ය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

07. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව පැමිණෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
පූගොඩ.

2020 ජනවාරි මස 13 වැනි දින,
පූගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2020 පෙබරවාරි මස 10 වැනි දින පැවැත්වීමට නියමිත වෙන්දේසියට අදාළ නඩු භාණ්ඩ ලැයිස්තුව**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ ලැයිස්තුව* |
|---|---|---|
| 1. | 85201 | WPUF 5952 යතුරු පැදිය |
| 2. | 43880 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01යි |
| | | ගෑස් සිලින්ඩර් 01යි |
| | | රබර් බට 01යි |
| | | බැරල් රඳවන ආධාරක 01යි |
| 3. | 29497 | ඉල්ලන්කූරු 01යි |
| 4. | 41100 | සවල් 01 |
| 5. | 21182 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| | | ගෑස් සිලින්ඩර් 01 |
| | | බැරලය රඳවන ස්ටෑන්ඩ් 01 |
| 6. | 19277 | නොකියා වර්ගයේ ජංගම දුරකථන 01යි |
| 7. | 35680 | සවල් 01, ප්ලාස්ටික් බාල්දි 01, විල්බැරෝ 01 |
| 8. | 38826 | ඇලුමිනියම් මුට්ටි 01 |
| | | ඇලුමිනියම් කල 01 |
| | | මැටි මුට්ටි 01 |
| | | ගෑස් ලිප් 01 |
| | | ගෑස් සිලින්ඩර් 01 |
| 9. | 42981 | සවල් 01 |
| | | බාල්දි 01 |
| 10. | 22140 | කොළපාට දැල් රෝල් 01 |
| 11. | 23155 | ගෑස් ලිප් 01, රෙගියුලේටරය සහිත බට 01යි |
| | | ගෑස් සිලින්ඩර් 02 |
| 12. | 16750 | ගෑස් සිලින්ඩර් 01 |
| | | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| 13. | 20181 | බාල්දි 03 |
| | | ගැරුම් වට්ටි 01 |
| | | අලවංගු 01 |
| | | කිමිදුම් ඇස් ආවරණ 01 |
| | | පොහොර කවර 25 |
| | | ඔක්සිජන් සිලින්ඩර් 03යි (අඩි 4.10 උස) |
| 14. | 69421 | බාල්දි 01, බට කුඩ 01 |
| | | සවල් 01 |
| 15. | 69422 | බාල්දි 01, බට කුඩ 01 |
| | | සවල් 01 |
| 16. | 66485 | බාල්දි 01 |
| 17. | 36351 | බාල්දි 01 |
| 18. | 21167 | සවල් 01 |
| 19. | 21166 | සවල් 01 |
| 20. | 18239 | බාල්දි 01, සවල් 01 |
| 21. | 47111 | බාල්දි 01, සවල් 01 |
| 22. | 18221 | රෙගියුලේටරය සහිත ගෑස් සිලින්ඩර් 01 |
| 23. | 18359 | සවල් 02 |
| 24. | 43860 | වේවැල් කුඩ 01යි |
| 25. | අංක රහිත | වීදුරු බෝතල් තොගය |
| 26. | අංක රහිත | බූලි තොගය |
| 27. | අංක රහිත | බැරල් තොගය. |

01-780

## මහාධිකරණය - කුලියාපිටිය

01. අධිකරණය වෙත ඉදිරිපත් කොට රාජසන්තක කරන ලද හා භාවිතයෙන් ඉවත් කල අබලි ද්‍රව්‍යය ද පහත උපලේඛනයේ අනු අංක 01-19 දක්වා සඳහන් භාණ්ඩ 2020.02.14 දින ප. ව. 1.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙම වෙන්දේසිය කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳ වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 10 ට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය පරිදි පරීක්ෂා කර බැලිය හැක.

04. වෙන්දේසියේ දී මිල දී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා එදින ම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. ගැනුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

06. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කරන පැමිණිලි භාරගනු නොලැබේ.

ජගත් ඒ කහඳගමගේ,
මහාධිකරණ විනිසුරු,
වයඹ පළාත්බද මහාධිකරණය,
කුලියාපිටිය.

2020 ජනවාරි මස 09 වැනි දින,
කුලියාපිටිය මහාධිකරණයේ දී ය.

උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | HC 125/17 | 300-7508 OPEL කාර් රථය |
| 02. | HC 239/07 | 101 ශ්‍රී 0946 CB 125 හොණ්ඩ වර්ගයේ යතුරු පැදිය |
| 03. | HC 64/05 | 93- 6351 යමහා වර්ගයේ සී. ඩී. 50 යතුරු පැදිය |
| 04. | HC 52/15 | එම්. ඩී. 90 වර්ගයේ රතු පැහැති අබලන් යතුරු පැදිය (අබලි) |
| 05. | HC 135/11 | අංක රහිත හොණ්ඩා 90 වර්ගයේ යතුරු පැදිය (අබලි) |
| 06. | HC 42/08 | 1. උදැල්ල<br>2. ලුමාලා වර්ගයේ පාපැදිය |
| 07. | HC 20/10 | අත් පොරව 01යි |
| 08. | HC 93/09 | උදලු 01යි |
| 09. | HC 12/10 | උදලු 01යි |
| 10. | HC 217/13 | තලය කැඩී ඇති උදලු 01යි |
| 11. | HC 38/15 | අත් පොරව 01යි |
| 12. | HC 56/16 | අත් පොරව 01යි |
| 13. | HC 189/04 | ලන්සු 03යි |
| 14. | HC 26/15 | පොල් උල් 01යි |

**භාවිතයෙන් ඉවත් කරන ලද අබලි ද්‍රව්‍ය**

15. ගලවා ඉවත් කරන ලද අඩි 03 යි අඟල් 11 පමණ දිග, පළල අඩි 01 යි අඟල් 10 වන යකඩ ග්‍රිල් එක සවිකර තිබූ ජනෙල් පියන සහිත ජනේල 01යි
16. WPKP 3731 නිල රථයෙන් ඉවත් කරන ලද YOKOHAMA වර්ගයේ ටයර් 04යි
17. ඉවත් කරන ලද කොමඩ් 01යි
18. ලී උළුවහු 01යි
19. ලී දොර 01යි

01-690

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - ගම්පොළ**

රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මෙම අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ 2020.02.11 වැනි දින පෙ. ව. 9.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පවත්වන දිනයේ පෙ. ව. 8.30 ට පෙර හිමිකම් තහවුරු කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පවත්වන දින පෙ. ව. 8.30 සිට 9.00 දක්වා වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදල් වලින් ගෙවිය යුතු අතර, චෙක්පත් භාර ගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා සෑම අයෙකුට ම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර මිලදී ගන්නා සියලුම භාණ්ඩ එදින ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

ශ්‍රීනිත් විජේසේකර,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය,
ගම්පොල.

2020 ජනවාරි මස 07 වැනි දින,
ගම්පොළ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**ගම්පොළ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ භාණ්ඩ ලැයිස්තුව**

| *නඩු අංකය* | *වාහන අංකය* | *වාහන වර්ගය* |
|---|---|---|
| 5118 | CPQUS 9524 | ත්‍රීවිල් රථය |
| 4305 | 28 ශ්‍රී 9760 | ලොරි රථය (කොටස් කර විකිණීම සඳහා) |

01-662

# රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

නේෂන් ලංකා ප්‍රමෝෂන්ස් ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි අංකය පී. බී. 4999)

2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (5) වගන්තිය ප්‍රකාරව නේෂන් ලංකා ප්‍රමෝෂන්ස් ලිමිටඩ් සමාගමේ නාමය දෙසැම්බර් මස 31 වැනි දින සිට 2019 බලපැවැත්වෙන පරිදි ''නේෂන් ලංකා ප්‍රමෝෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' ලෙස 11(2) වගන්තියේ නියමයන් පරිදි වෙනස් කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ ලියාපදිංචි අංකය : 4999
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 14, රීඩ් ඇවනිව්, කොළඹ 07.

මණ්ඩලයේ නියමය පරිදි,

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

01-571

**දැනුම්දීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්ති අනුව 2019.12.30 දින පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : වේල් ගෲප් සිලොන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 00218907
ලියාපදිංචි ලිපිනය : 15, වෙල්ලවත්ත, හික්කඩුව 80240

මරියටා සිරිවර්ධන,
සමාගම් ලේකම්.

01-572

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 05, ටොරින්ටන් ඇවනියු, ටොරින්ටන් නිවාස සංකීර්ණයේ අංක E 39 දරන ස්ථානයේ පදිංචි සුරේෂ් කනිෂ්ඨ මාලියැද්ද (ජා. හැ. අංක 720580799 V) වන මා විසින් කොළඹ 05, ටොරින්ටන් ඇවනියු, ටොරින්ටන් නිවාස සංකීර්ණයේ අංක E 39 දරන ස්ථානයේ පදිංචි විනෝලා මාලියැද්ද විවාහයට පෙර මිගෙල් (ජා. හැ. අංක 728234032 V) යන අයට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රිමාලි මහේෂිකා ද සොයිසා ගුණසේකර මහත්මිය විසින් වර්ෂ 2011 ක් වූ ජූලි මස 07 වැනි දින ලියා සහතික කළ අංක 1766 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් බලය පවරා ඇති අතර, වර්ෂ 2020ක් වූ ජනවාරි මස 07 වැනි දින සිට එකී අංක 1766 දරන ඇටෝර්නි බලපත්‍රය බල රහිත සහ අවලංගු කරන ලද ලේඛනයක් බවත් මෙතැන් පටන් එකී අංක 1766 දරන ඇටෝර්නි බලපත්‍රයේ කිසිදු වලංගු භාවයක් නොමැති බවත්, එකී අංක 1766 දරන ඇටෝර්නි බලපත්‍රයේ ඇටෝර්නි අධිපති, සුරේශ් කනිෂ්ඨ මාලියැද්ද වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලුම රට වැසියන්ට මෙයින් දැනුම් දෙමි.

සුරේශ් කනිෂ්ඨ මාලියැද්ද,

2020 ජනවාරි මස 07 වැනි දින.

01-575

## සීමිත වගකීම් සමාගම් සංස්ථාගත කිරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : අගම්පොඩි මෙන්ඩිස් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය : පී වී 00217870
ලියාපදිංචි කාර්යාලය : දෙරලහේන තේ කර්මාන්ත ශාලාව, තල්ගස්යාය, අක්මීමන.
තැපැල් කේතය : 80000
සංස්ථාගත කළ දිනය : 2019.11.25

සමාගම් ලේකම්වරු.

01-582

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

යාපනය, කොන්ඩාවිල්, දුම්රියපළ පාර පදිංචි කනගසබෙයි බාලචන්ද්‍රන් වන මා විසින් යාපනය, නල්ලූර් හරස් පාර, නො. 08 හි පදිංචි සිවලිංගම් රැතිරලිංගම් වෙත බලය පවරන ලද මනිපායිහි, ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වසන්ත සේනන් මහතා සහතික කළ අංක 11471 හා 2017.04.01 දිනැති ඇටෝර්නි බලපත්‍රය 2020 ජනවාරි මස 06 වැනි දින සිට අහෝසි කර අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත මෙයින් දැනුම් දෙමි.

කනගසබෙයි බාලචන්ද්‍රන්.

01-583

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

දකුණු ඉන්දියාවෙහි, තමිල්නාඩු, කොයිම්බතූර් - 12, ගාන්ධිපුරම් සාති රෝඩ්, බී. කේ. ආර්. නගර් 19/1, පදිංචි ජී. සකුන්තලා හෙවත් කන්නාතාල් වන මම බම්බලපිටිය, ගාලු පාර, අංක 339 දරන ස්ථානයෙහි පදිංචි සිදම්බරම් සුබ්‍රමනියම් චෙට්ටියාර් යන අයට ප්‍රසිද්ධ නොතාරිස් කේ. කලෛයිඅප්පන් විසින් ලියා සහතික කළ අංක 189 සහ 2010.04.06 දිනැති ඇටෝර්නි බලය 2020.01.04 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් කරනු ලබන ක්‍රියාවකට මා විසින් වග නොකියන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ජී. සකුන්තලා හෙවත් කන්නාතාල්.

01-588/1

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

දකුණු ඉන්දියාවෙහි, තමිල්නාඩු, සිවගන්ගයි දිස්ත්‍රික්, නාඩරසන් කෝට්ටයි, වල්ලලාර් වීදිය, 8/1 පදිංචි කේ. එන්. රාමනාදන් වන මම බම්බලපිටිය, ගාලු පාර, අංක 339 දරන ස්ථානයෙහි පදිංචි සිදම්බරම් සුබ්‍රමනියම් චෙට්ටියාර් යන අයට ප්‍රසිද්ධ නොතාරිස් කේ. කලෛයිඅප්පන් විසින් ලියා සහතික කළ අංක 184 සහ 2010.03.15 දිනැති ඇටෝර්නි බලය 2020.01.04 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් කරනු ලබන ක්‍රියාවකට මා විසින් වග නොකියන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

කේ. එන්. රාමනාදන්.

01-588/2

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

දකුණු ඉන්දියාවෙහි, තමිල්නාඩු, චෙන්නායි, මයිලාපූර්, සොලයිඅප්ප මුදලිවීදිය, අංක 5 සහ (පෙර අංක 2 පදිංචි) සාරදා චෝක්කලිංගම් වන මම බම්බලපිටිය, ගාලු පාර, අංක 339 දරන ස්ථානයෙහි පදිංචි සිදම්බරම් සුබ්‍රමනියම් චෙට්ටියාර් යන අයට ප්‍රසිද්ධ නොතාරිස් කේ. කලෛයිඅප්පන් විසින් ලියා සහතික කළ අංක 190 සහ 2010.04.06 දිනැති ඇටෝර්නි බලය 2020.01.04 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් කරනු ලබන ක්‍රියාවකට මා විසින් වග නොකියන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

සාරදා චෝක්කලිංගම් හෙවත් වල්ලිඅම්මෙයි.

01-588/3

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

දකුණු ඉන්දියාවෙහි, තමිල්නාඩු, සිවගන්ගයි දිස්ත්‍රික්, නාඩරසන් කෝට්ටයි, වල්ලලාර් වීදිය, 8/1 පදිංචි එල්. වල්ලිඅම්මෙයි වන මම බම්බලපිටිය, ගාලු පාර, අංක 339 දරන ස්ථානයෙහි පදිංචි සිදම්බරම් සුබ්‍රමනියම් චෙට්ටියාර් යන අයට ප්‍රසිද්ධ නොතාරිස් කේ. කලෙයිඅප්පන් විසින් ලියා සහතික කළ අංක 182 සහ 2010.03.15 දිනැති ඇටෝර්නි බලය 2020.01.04 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් කරනු ලබන ක්‍රියාවකට මා විසින් වග නොකියන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

එල්. වල්ලිඅම්මෙයි.

01-588/4

---

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

දකුණු ඉන්දියාවෙහි, තමිල්නාඩු, සිවගන්ගයි දිස්ත්‍රික්, කාරයිකුඩි මුත්තුපට්ටින්ම්, වල්ලලාර් වීදිය, 2 වන වීදිය, නො. 68/1 හි පදිංචි කේ. එන්. විශාලාක්ෂි වන මම බම්බලපිටිය, ගාලු පාර, අංක 339 දරන ස්ථානයෙහි පදිංචි සිදම්බරම් සුබ්‍රමනියම් චෙට්ටියාර් යන අයට ප්‍රසිද්ධ නොතාරිස් කේ. කලෙයිඅප්පන් විසින් ලියා සහතික කළ අංක 181 සහ 2010.03.15 දිනැති ඇටෝර්නි බලය 2020.01.04 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් කරනු ලබන ක්‍රියාවකට මා විසින් වග නොකියන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

කේ. එන්. විශාලාක්ෂි.

01-588/5

---

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

දකුණු ඉන්දියාවෙහි, තමිල්නාඩු, සිවගන්ගයි දිස්ත්‍රික්, ඔක්කූර්, ප්‍රධාන පාර පදිංචි වී. ආර්. සී. මීනාක්ෂි වන මම බම්බලපිටිය ගාලු පාර, අංක 339 දරන ස්ථානයෙහි පදිංචි සිදම්බරම් සුබ්‍රමනියම් චෙට්ටියාර් යන අයට ප්‍රසිද්ධ නොතාරිස් කේ. කලෙයිඅප්පන් විසින් ලියා සහතික කළ අංක 183 සහ 18/2008 2010.03.15 දිනැති ඇටෝර්නි බලය 2020.01.04 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් කරනු ලබන ක්‍රියාවකට මා විසින් වග නොකියන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

වී. ආර්. සී. මීනාක්ෂි.

01-588/6

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : එස් එම් ජේ සී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00218090
ලියාපදිංචි ලිපිනය : අංක 533/2, කුරුදුවත්ත, 2 වන පටුමග, ඇවරිවත්ත පාර, වත්තල.

සමාගම් අධ්‍යක්ෂක.

01-614

## ඇටර්නි බලය අවලංගු කිරීම

තලවතුගොඩ, අනගාරික ධර්මපාල පෙදෙස, අංක 506 දරන ස්ථානයේ පදිංචි ජා. හැ. අ. 637601563 V දරන ගම්පොළගේ මායා මේසලතා ෆොන්සේකා වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. ඩී. දිසානායක මිය විසින් වර්ෂ 2010 ක්වූ නොවැම්බර් මස 4 වැනි දින ලියා සහතික කළ අංක 5465 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරු ලෙස කොහුවල, ග්‍රීන් පාත්, අංක 196 C යන ලිපිනයේ පදිංචි ගම්පොළගේ අරුනාලෝක ෆොන්සේකා (ජා. හැ. අ. 562580662 V) යන අය පත්කිරීම වර්ෂ 2020ක් වූ ජනවාරි මස 06 වැනි දින සිට නීත්‍යානුකූලව අවලංගු කරන බව මෙයින් සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස නිවේදනය කරනු ලැබේ.

ගම්පොළගේ මායා මේසලතා ෆොන්සේකා.

01-618

## ඇටර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සියලු මහජනතාව වෙත දන්වා සිටින වග නම් මාරවිල කුරුඳුවත්ත ''දීපසේවා'' හි පදිංචි ජා. හැ. අංක 676723870 V හිමි වර්ණකුල වීරසූරිය සිල්විනා මල්කාන්ති ෆර්නෑන්ඩෝ වන මා විසින් ඉහත ලිපිනයේ ම පදිංචි ජා. හැ. අංක 441993900 V හිමි වර්ණකුල වීරසූරිය ඇලෙක්සිස් බෙනඩික් ඩී ලොස්තා ෆර්නෑන්ඩෝ නොහොත් වර්ණකුල වීරසූරිය ඇලෙක්සිස් බෙනඩික් වෙත පවරා දී ඇති වර්ෂ 2014ක් වූ දෙසැම්බර් මස 10 වැනි දින ඩබ්ලිව්. එස්. එන්. තිසේරා නීතිඥ මහත්මිය විසින් වෙන්නප්පුව දි සහතික කළ අංක 1953 දරන සාමාන්‍ය ඇටෝර්නි බලපත්‍රය මින් අවලංගු, ශුන්‍ය හා බලරහිත වන බවත් මින් ඉදිරියට එකී ඇටෝර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගණුදෙනුවකට මා වග නොකියන බව ද මෙයින් දන්වමි.

වර්ණකුල වීරසූරිය සිල්විනා මල්කාන්ති ෆර්නෑන්ඩෝ.

01-737

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## පබ්ලික් බැංකුව බර්හාඩ් - ගාල්ල ශාඛාව

1988 අංක 30 දරන පනතේ බැංකු ව්‍යාපාරයේ අර්ථය ඇතුළත බලයලත් වාණිජ බැංකුවක් වන සහ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය සහ එහි සංශෝධන (''එකී 1990 අංක 4 දරන පනත'') මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුව තුළ කලින් තල්පේ ග්‍රාම නිලධාරී කොට්ඨාසය ලෙස විස්තර කරන ලද අංක 133 සී, නාගහවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කලින් හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ලෙස විස්තර කරන ලද අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලින් හබරාදූව ප්‍රාදේශීය සභාව ලෙස විස්තර කරන ලද අක්මීමන ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කලින් තල්පේ ලෙස හඳුන්වන මහරම්බ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඇන්ටන් සමරරත්න විසින් 2014 ජුනි 15 වැනි දින පිළියෙල කරන ලද අංක 3786 A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A (බලයලත් මිනින්දෝරු ඇන්ටන් සමරරත්න විසින් 2012 පෙබරවාරි 18 වැනි දින පිළියෙල කරන ලද අංක 3786 දරන පිඹුරේ දැක්වෙන ''ළිඳමුලවත්ත'' හි බෙදා මායිම් නියම කරන ලද ලොට් A සහ ''දෙල්ගහවත්ත'' හි බෙදා මායිම් නියම කරන ලද ලොට් අංක 1 යන යාබද සහ ඒකාබද්ධ කරන ලද දෙකෙහි ඒකාබද්ධ කිරීමෙන් නැවත මැනීමක් වන)

ප්‍රමාණය : පර්චස් දාහතයි දශම හයයි අටක් (අ. 0 රූ. 0 පර්. 17.68) ක් හෙවත් හෙක්ටයාර් 0.0447 විශාල ඉඩම සමග පස්, ගොඩනැගිලි, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

''ගුළුව හේවගේ සිසිර කුමාර යන අය විසින් පබ්ලික් බැංකුව බර්හාඩ් හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2020 ක් වූ පෙබරවාරි මස 14 වැනි දින ප. ව. 1.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.11.15 වැනි දින රජයේ ගැසට් පත්‍රය, දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.* - ගාල්ල - මාතර පාර ඔස්සේ දළවැල්ල හන්දිය දක්වා ගමන් කර එතැන් සිට වමට ඇති මෙතරම්බ පාර ඔස්සේ තවත් කිලෝමීටර් 1/4ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ මෙම පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තුව, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී අංක 340, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03 හි පබ්ලික් බැංකුව බර්හාඩ් හි තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,<br>
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,<br>
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12<br>
දුරකතන /ෆැක්ස් 011- 2445393<br>
ඊමේල් : senaservice84@gmail.com

ණය ප්‍රධානී,<br>
පබ්ලික් බැංකුව බර්හාඩ්,<br>
අංක 340, ආර්. ඒ. ද මැල් මාවත,<br>
කොළඹ 03.<br>
දුරකථන අංක : 077-7679589.

01-619

**මහජන බැංකුව - සීදුව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් කටුනායක සීදුව නගර සභා සීමාව තුළ කොටුගොඩ පාරේ, පඹුරුගහවත්ත නමැති ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : (අක්. 0, රූ. 0, පර්. 3.65)

විශාල ඉඩම සහ ගොඩනැගිල්ල මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2020 පෙබරවාරි මස 13 වැනි දින (බ්‍රහස්පතින්ද) පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 1998.05.06 දිනද, ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 1998.04.10 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - සීදුව හන්දියෙන් කොටුගොඩ පාරට හැරී සැ. 3/4 ක් පමණ ගිය විට පල්ලිය හන්දියෙ වම් පසින් අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් (සියයට එකක්),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් (සියයට දෙකහමාරක්) සහ එම කොමිස් මුදලට අදාළ සියළුම බදු,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,500,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කළමණාකරු මහජන බැංකුව සීදුව ශාඛාව වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක : 033 - 2222325, 033 - 2225008, 033- 2231901
ෆැක්ස් අංක : 033 - 2226165, 033 - 2226741

''ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ශොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 128 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 A, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

01- 620

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ෆෙයාර්වේ මිනර්වා (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0122 1000 4600.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.11.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එකසිය හතර කෝටි හතලිස් හත් ලක්ෂ විසි එක් දහස් නමසිය හැත්තෑ හතයි ශත හැට තුනක (රු. 1,044,721,977.63) මුදල ද, 2019 නොවැම්බර් මස 05 වැනි දින සිට අංක 1306 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් කෝටි සියයක (රු. 1,000,000,000) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Two decimal Five per centum (2.5%) per annum බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ

වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.12.20 දින රජයේ *ගැසට් පත්‍රයේ* 2019.12.09 දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2020.02.10 දින පෙ. ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන කේ. පී. එන්. සිල්වා යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, C 31 පිටකොටුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කෙහෙල්වත්ත, වෝඩ් අංක 18, අලුත්කඩේ පිහිටි ඕල්කොට් මාවත, වරිපනම් අංක 341, 341/1 දරන පරිශ්‍රයන් බලයලත් මානක තැන කේ. ජී. සී. කුලවංස යන අය විසින් සාදන ලද 2013 සැප්තැම්බර් මස 25 දාතම හා අංක 47-2013 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ලොට් X වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 331 දරන පරිශ්‍රයන්, ඕල්කට් මාවත (පොලිස් නිල නිවාස) සහ වරිපනම් අංක 8 සහ 10 දරන පරිශ්‍රයන්, ට්‍රිනිටි පෙදෙස (මිහිඳු විද්‍යාලය), නැගෙනහිරට : වරිපනම් අංක 8 සහ 10 දරන පරිශ්‍රයන්, ට්‍රිනිටි පෙදෙස (මිහිඳු විද්‍යාලය) සහ එම් ඩී ගුණසේන මාවත, දකුණට : පාර සහ ඕල්කට් මාවත සහ බස්නාහිරට : ඕල්කොට් මාවත සහ වරිපනම් අංක 331 දරන පරිශ්‍රයන්, ඕල්කට් මාවත (පොලිස් නිල නිවාස) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් පහයි දශම දෙකයි පහක් (A:0, R:3, P:5.25) විශාල ඉඩම් කොටස එකී අංක 47-2013 දරන පිඹුරට අනුවය.

එකී ලොට් X පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, C 31 පිටකොටුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සෙන් සෙබස්තියන් වෝර්ඩ් හි පිහිටි වරිපනම් අංක 341 දරන බලයලත් මානක තැන පී. ආර්. බොතේජු යන අය විසින් සාදන ලද 1946 නොවැම්බර් මස 29 දාතම හා අංක 3 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ලොට් C1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 331 දරන පොලිස් නිල නිවාස, (නොරිස් පාර), වරිපනම් අංක 8 සහ 10 දරන ට්‍රිනිටි දෙව්මැදුර පරිශ්‍රයන්, ට්‍රිනිටි පෙදෙස, නැගෙනහිරට : ලොට් C2, දකුණට : වරිපනම් අංක 343 දරන ලොට් D (නොරිස් පාර) සහ බස්නාහිරට : (නොරිස් පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විස්සක් (A:1, R:0, P:20) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සැම සියලු දේ එකී අංක 3 දරන පිඹුරට අනුව D 181/122 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-518